රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි : 03/2014

මගේ අංකය: EST-8/ALOWN/06/0719/25(V)G
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07

2014.07.09

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>විනයානුකූල පරීක්ෂණ සඳහා ගෙවීම්</u>**

ඉහත කරුණ පිළිබඳ 2011.11.22 දිනැති අංක 19/2005 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. එම චක්‍රලේඛයේ 07 වගන්තිය යටතේ පරීක්ෂණ නිලධරයාට අමතර දීමනාව ගෙවීම පිළිබඳව විවිධ ආයතන මා වෙතින් විමසීම් කර ඇත. විධිමත් විනය පරීක්ෂණය අවසන් කර වාර්තාව විනය බලධරයාට බාරදීමට නියමිත මාස 06ක කාල සීමාව තුල ඇති වූ, පරීක්ෂණ නිලධරයාට පාලනය කරගත නොහැකි හේතුවක් මත එම වාර්තාව බාර දීම ප්‍රමාද වී ඇත්නම් හා ඒ බව සනාථ කර ගත හැකි නම් ඔහුට ගෙවනු ලබන අමතර රු. 3000/- ක දීමනාව ද අඩු නොකර ගෙවීම් කළ හැකිය. එම දීමනාව අඩු නොකර ගෙවීමේදී එසේ තීරණය කිරීමට හේතු වූ කරුණු විනය බලධරයා විසින් පැහැදිලිව සටහන් කර තැබිය යුතු බව වැඩිදුරටත් දන්වමි.

පී.බී.අබේකෝන්
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය